## තුන්වැනි කොටස

## මුදල් මණ්ඩලය විසින් 1980 දී උපයෝගී කරගනු ලැබූ ප්‍රධාන පරිපාලන විධිවිධාන


| | | | පිටුව |
|---|---|---|---|
| 1. | අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාත— | චක්‍රලේඛ අංක 475 | 137 |
| 2. | වෙළෙඳ බැංකු ණය— .. | චක්‍රලේඛ අංක 476 | 137 |
| 3. | භාරක බැඳුම්කර— .. | චක්‍රලේඛ අංක 482 | 138 |
| 4. | ශ්‍රී ලංකා මහ බැංකුව-1985 6% භාරක බැඳුම්කර— | චක්‍රලේඛ අංක 536 | 141 |
| 5. | වෙළෙඳ බැංකු ණය— .. | චක්‍රලේඛ අංක 537 | 142 |
| 6. | ආසියානු මූල්‍ය ඒකකය, බංගලාදේශ ටාකා, බුරුම ක්යාට්, ඉන්දියානු රුපියල, අයිරාන රියාල්, නේපාල රුපියල හා පකිස්තානු රුපියල සඳහා මහ බැංකු විනිමය අනුපාතිකයන් .. | | 143 |
| 7. | ආසියානු නිෂ්කාශන සංගමය මගින් කෙරෙන මෙහෙයවුම් කටයුතු සඳහා වෙළෙඳ බැංකු විනිමය අනුපාතිකයන් .. | | 144 |
| 8. | වෙළෙඳ බැංකු වලින් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිළදී ගැනීම සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතිකයන් .. | | 145 |

චක්‍රලේඛ අංක: 475

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1980 අප්‍රේල් 21 වැනි දින.

## අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාත

(යොමුව: මුදල් නීති පනතේ 83 සහ 87 ඡේද)

1. රජයේ සහ රජය විසින් සහතික කළ සුරැකුම්පත් ඇපයට තබා වෙළෙඳ බැංකු ලබාගන්නා අත්තිකාරම් සඳහා මහ බැංකුව විසින් අය කැරෙන වාර්ෂික පොළී අනුපාතිකය 1980 අප්‍රේල් 21 වැනි දින සියයට 12 ක් වේ.

2. වාණිජ සහ නිෂ්පාදන ණය සම්බන්ධිත භාවිතීය පොරොන්දු පත්‍ර ඇපයට තබා වෙළෙඳ බැංකු ලබාගන්නා අත්තිකාරම් සඳහා මහ බැංකුව විසින් අය කැරෙන වාර්ෂික පොළී අනුපාතිකය 1980 අප්‍රේල් 21 වැනි දින සිට සියයට 12 ක් වේ.

3. 1977 අගෝස්තු 31 වැනි දින හා අංක 240 දරන චක්‍රලේඛය මින් ඉවත් කෙරේ.

යු- ඒ. ද සිල්වා
ප්‍රධාන ගණකාධිකාරී.

වර්ණසේන රාසපුත්‍රම්
අධිපති.

---

චක්‍රලේඛ අංක : 476

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1980 අප්‍රේල් 21 වැනි දින.

## වෙළෙඳ බැංකු ණය

1980 අප්‍රේල් මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, වෙළෙඳ බැංකුවක් මහ බැංකු පොළී අනුපාතිකය මත මහ බැංකුව වෙතින් ණයට ගත් මුදල් ප්‍රමාණයේ ගෙවා නිම කිරීමට ඇති කොටස, 1979 දෙසැම්බර් 31 වැනි දිනට එකී බැංකුව සතුව පැවති පහත දැක්වෙන වත්කම් ශීර්ෂයන්ගේ වටිනාකමින් සියයට 4 කට වඩා වැඩි නොවිය යුතු බැව් සියළුම වෙළෙඳ බැංකුවලට මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. වට්ටම් කරන ලද සහ මූල්‍ය පහසුකම් සපයන ලද බිල්පත්;
2. ණය (රජයේ කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රම යටතේ සපයන ලද ණය මුදල් හැර) සහ
3. අයිරාවන්.

රජයේ කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රම යටතේ, සහතික මිළ ක්‍රමය සහ මැද සහ දිගුකාලීන ණය අරමුදල යටතේ සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම්, 'මහ බැංකුව වෙතින් ණයට ගත් මුදල්' යටතට නොගැනේ.

කෙසේ වුවද, තාවකාලික මුදල් හිඟයන් පියවා ගැනීම අරභයා වෙළෙඳ බැංකු විසින් මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්, නියමිත සීමාව ඉක්මවා වුවද සළකා බැලීමට මහ බැංකුව සූදානම්ය. එවැනි අනුග්‍රහයන් පහත දැක්වෙන පදනම මත අනුමත කෙරේ.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| i. | නියමිත | සීමාව | ඉක්මවන | පළමුවන | සියයට | 10 | — | 20% | වාර්ෂිකව |
| ii. | නියමිත | සීමාව | ඉක්මවන | දෙවන | සියයට | 10 | — | 21% | වාර්ෂිකව |
| iii. | නියමිත | සීමාව | ඉක්මවන | තෙවන | සියයට | 10 | — | 22% | වාර්ෂිකව |
| iv. | නියමිත | සීමාව | ඉක්මවන | සතරවන | සියයට | 10 | — | 24% | වාර්ෂිකව |
| v. | නියමිත | සීමාව | ඉක්මවන | පස්වන | සියයට | 10 | — | 26% | වාර්ෂිකව |
| vi. | ඉතිරිය | | | | | | — | 30% | වාර්ෂිකව |

1979 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 419 දරන මහ බැංකු චක්‍රලේඛය ඉවත් කෙරේ. කෙසේ වුවද, 1976 ඔක්තෝබර් මස 04 වැනි දින හා අංක 169 දරන චක්‍රලේඛයේ 2 ඡේදයේ දක්වෙන විධිවිධාන තවදුරටත් ක්‍රියාත්මක වේ. එකී සෑම වෙළෙඳ බැංකුවක් විසින්ම

(අ) අත්‍යවශ්‍ය නොවන කටයුතු සඳහා අනුමත කරන ලද ණය සහ අත්තිකාරම්වල මුළු ප්‍රමාණය 1976 ජුනි 30 වැනි දිනට පෙර අත්‍යවශ්‍ය නොවන කටයුතු සඳහා අනුමත කළ ණය සහ අත්තිකාරම්වල මුළු ප්‍රමාණය සහ එදිනට ගෙවීමට ඉතිරිව තිබූ ණය ප්‍රමාණය නොඉක්මවන බවට සහ

(ආ) 1978 මාර්තු 27 වැනි 'දින සහ අංක 289 දරන ශ්‍රී ලංකා මහ බැංකු චක්‍රලේඛයට යටත්ව (අනුකූලව), මහජනයාට මුදල් ණයට දෙන සහ හෝ කුලී ගැණුම් කාර්යයන්හි නිරත බැංකු නොවන සමාගම් සහ ආයතනවලට දෙන ලද. ණය සහ අත්තිකාරම් එකී සමාගම් සහ ආයතන වලට දෙන ලද, එහෙත් 1976 ජුනි 30 වැනි දිනට නොපියවා ගන්නා ලද මුළු ණය සහ අත්තිකාරම්වලට වැඩි නොවන බවට වෙළෙඳ බැංකු විසින් වගබලාගත යුතුය.

යූ. ඒ. ද සිල්වා
ප්‍රධාන ගණකාධිකාරී.

වර්ණසේන රාසපුත්‍රම්
අධිපති.

---

චක්‍රලේඛ අංක : 482

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1890 මැයි 27 වැනි දින.

## භාරක බැඳුම්කර

ශ්‍රී ලංකා මහ බැංකුව සිය බැඳුම්කර සහතික පත් නිකුත් කිරීමට විධිවිධාන යොදා ඇත. මෙකී බැඳුම්කර "භාරක බැඳුම්කර" පරිද්දෙන් නිකුත් කැරෙන අතර බැඳුම්කර සහ ඒවාට යාකොට ඇති පොළී කූපන් පත් දෙවර්ගයම භාරදීමෙන් එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට මාරු කළ හැක.

භාරක බැඳුම්කර යෝජනා ක්‍රමයේ මූලික ලක්ෂණ පහතින් පළවේ.

(i) මුල් මුදල

භාරක බැඳුම්කර රු. 5,000 ක මුණත වටිනාකමකින් යුක්ත වේ. ආරම්භක අවස්ථාවේදී ඒවා නිකුත් කැරෙන්නේ සියයට 5 ක වට්ටමක් සහිතවය. කල් පිරීමේදී මෙකී බැඳුම්කර සම මිලට නිදහස් කරනු ඇත.

(ii) කල් පිරීමේ සීමාව

මෙකී බැඳුම්කරවල කල් පිරෙන දිනය 1985 මාර්තු 1 වැනි දිනයයි.

(iii) නිකුත් කැරෙන ස්ථානය

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකාවේ පිහිටි ඕනෑම වෙළෙඳ බැංකුවක ප්‍රධාන කාර්යාලය හෝ ශාඛා කාර්යාලයක් මගින් හෝ මෙකී බැඳුම්කර නිකුත් කැරේ.

(iv) ආපසු ගෙවන ස්ථානය

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකාවේ පිහිටි ඕනෑම වෙළෙඳ බැංකුවක ප්‍රධාන කාර්යාලය හෝ ශාඛා කාර්යාලයන් මගින් හෝ මෙකී බිල්පතක් කල් පිරෙන අවස්ථාවේදී එහි මූණත වටිනාකම නැවත ගෙවනු ලබයි.

(v) පොළිය

(අ) බැඳුම්කරයේ මූණත වටිනාකම මත ගණනය කරන ලද සියයට 6 ක පොළිය අර්ධ වාර්ෂිකව එකී බැඳුම්කරයට යාකොට ඇති පොළී කූපනයෙහි සඳහන් දිනයන්හිදී ගෙවනු ලැබේ.

(ආ) බැඳුම්කර නිකුත් කළ දිනයේ සිට පොළී මුදල ගෙවිය යුතු දිනය දක්වා, දෙදිනම ඇතුළත් වන පරිදි, අනුපාත පදනමක් මත ගෙවනු ලබන පොළිය ගණන් බැලෙයි.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවට හෝ ඕනෑම වෙළෙඳ බැංකුවක ප්‍රධාන කාර්යාලයට හෝ ශාඛා කාර්යාලයකට පොළී කූපනය බාර දෙනු ලබන අවස්ථාවේදී එයට අදාල පොළිය ගෙවනු ඇත. මේ සඳහා බැඳුම්කරයක් සමගම පොළී කූපනයන් ඉදිරිපත් කිරීම අනවශ්‍යය.

(ඈ) කල් පිරීමේ දිනයෙන් අනතුරුව ඊට පොළියක් එකතු නොවේ.

(vi) බැඳුම්කරය හුවමාරු වීම

හුදු බාරදීමෙන් පමණක් බැඳුම්කරයේ අයිතිය නිදහසේ පැවරිය හැක. බැඳුම්කරය දරන්නා සිය අනන්‍යතාවය හෙළි නොකර නිදහසේ තවත් පුද්ගලයෙකුට බැඳුම්කරය බාර දීමෙන් එහි අයිතිය පැවරේ.

(vii) සුරක්ෂිත මුද්‍රණය

බැඳුම්කරය ආරක්ෂිත කඩදාසියක මුද්‍රණය කර ඇති අතර අනුක්‍රමික අංකයත් එහි මුද්‍රණය කොට ඇත. පොළී කූපන් පත් බැඳුම්කරයේ අනුක්‍රමික අංකයම දරන අතර 1 සිට 10 දක්වා අනුක්‍රමිකව මුද්‍රණය කොට ඇත. පොළී නියමිත දිනයන් සෑම කූපන් පතකම මුද්‍රණය කර තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිගේ මුද්‍රිත අත්සන සහ එහි සඳහන් නිලධාරීන් දෙදෙනෙකුගේ අත්සන් ද බැඳුම්කරය දරන්නීය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිතයෙක් වශයෙන් කටයුතු කරමින් මෙම බැඳුම්කර අලෙවි කරන මෙන් ශ්‍රී ලංකාවේ කටයුතු කරන සියලුම වෙළෙඳ බැංකුවලින් ඉල්ලා සිටිනු ලැබේ. ඒ අනුව, කොළඹ, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත කරන ඉල්ලීමකින් අනතුරුව යථෝක්ත බැඳුම්කර 100 ගුණිතවලින් ලබා දීමට කටයුතු කරන බව සියළුම වෙළෙඳ බැංකු වෙත නිවේදනය කැරේ. මෙම බැඳුම්කර ලබා ගැනීම සඳහා සෑම වෙළෙඳ බැංකුවකම සිය ක්‍රියා පටිපාටයන්ට අනුකූලව එක් අයෙක් හෝ ඊට වැඩි බලයලත් නිලධාරීන් විසින් අත්සන් කරනු ලැබූ මේ සමඟ අමුණා ඇති ඇමුණුමේ නියි පරිදි පුරවා කොළඹ 1, ශ්‍රී ලංකා මහ බැංකුවේ, ප්‍රධාන ගණකාධිකාරි වෙත ඉදිරිපත් කළයුතුය. බැඳුම්කර නිකුත් කිරීමට පෙර වටිනාකම යථා පරිදි සථාපිත කිරීමට මහ බැංකුවේ නිලධාරීන් දෙදෙනෙකු ඒ මත අත්සන් කළයුතු නිසා වෙළෙඳ බැංකු විසින් සිය අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සෑහෙන පරිදි කල්තබා මහ බැංකුවට දැනුම් දෙන්නේ නම් මැනවි.

සෑම මාසයකම 1 වැනි දින සහ 16 වැනි දින සිය බැඳුම්කර අලෙවිය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත සියළුම වෙළෙඳ බැංකු විසින් දැනුම් දිය යුතුවේ. එසේ බැඳුම්කර අලෙවිය පිළිබඳව වාර්තා කරන විට, වෙළෙඳ බැංකු විසින්, "ශ්‍රී ලංකා මහ බැංකුව භාරක බැඳුම්කර ගිණුම්" වෙනුවෙන් වෙක්පත් සහ අලෙවි කරන ලද බැඳුම්කරයන්ගේ අනුක්‍රමික අංක සඳහන් ලැයිස්තුවක්ද ඒ හා ඉදිරිපත් කළ යුතුය.

තමන් අලෙවි කරනු ලබන සියළුම බැඳුම්කරවල සහ පළමුවන කූපන් පතෙහි පිටුපස අලෙවි කරන දිනය වාණිජ බැංකු විසින් සඳහන් කළයුතු අතර එදින පටන් පොළිය එක් රැස්වීමට නියමිතය. තම තමන්ගේ බැංකු පිළිවෙත්වලට අනුකූලව එක් අයෙක් හෝ ඊට වැඩි බලය ලත් නිලධාරි/නිලධාරින්ගේ අත්සන් තබා උක්ත බැඳුම්කර යථා පරිදි සහතික කළ යුතුය. පොළී මුදල් නොලැබීමට සුදුසුකම් නොලබන කූපන් පත් සුදුසු පරිද්දෙන් රබර් මුද්‍රාවක් තබා අවලංගු කිරීමට බැඳුම්කර අලෙවි කරන බැංකු ඉතා ප්‍රවේශමෙන් වග බලා ගත යුතු අතර, එවැනි කූපන් පත් බැඳුම්කරයෙන් වෙන්කොට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගණකාධිකාරි තැන වෙත, මින් පෙර සඳහන් කළ පරිදි දෙසතියකට වරක් එවීමට නියමිත ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමේදී බැඳුම්කරයේ අනුක්‍රමික අංකයත් අවලංගු පොළී කූපන් පතෙහි අංකයත් එහි සඳහන් කළ යුතුය.

කූපන් පතකට පොළිය ගෙවන අවස්ථාවේදී යථෝක්ත ගෙවන බැංකුව විසින් කූපන් පත හරහා 'පොළිය ගෙවන ලදී' යනුවෙන් පිටයන් කළයුතු අතර එකී කූපන්පත්වලට මුදල් ලබාගනු වස් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එකී බැංකුව මහ බැංකුව සමග පවත්වාගෙන යන ජංගම ගිණුමට අදල මුදල බැර කිරීමට ක්ෂණිකව පියවර ගනු ඇත. ප්‍රතිපූරණය (වැය මුදල් ආපසු ගෙවීම) සඳහා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ඉල්ලීමක පහත සඳහන් විස්තර අඩංගු විය යුතුය.

(අ) පොළී ගෙවා ඇති බැඳුම්කරයන්හි අනුක්‍රමික අංක;

(ආ) පොළී ගෙවූ කූපන් පත් අංක එනම් අංක 1 හෝ අංක 2 හෝ අංක 3 යනාදි වශයෙන්; සහ

(ඇ) සෑම කූපන් පතකටම ගෙවූ පොළී මුදල.

ප්‍රතිපූරණය සඳහා ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑම් එකිනෙක බැංකුවේ පිළිවෙත්වලට අනුකූලව එක් බලය ලත් නිලධාරියකු විසින් හෝ එකට වැඩි බලය ලත් නිලධාරින් සංඛ්‍යාවක් විසින් හෝ සහතික කළ යුතුය.

බැඳුම්කරවලට මුදල් ගෙවූ අවස්ථාවකදී ප්‍රතිපූරණය සඳහා ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑම් හා පහත සඳහන් දේ එවිය යුතුය.

(අ) යථා පරිදි අවලංගු කළ බැඳුම්කර සහ;

(ආ) මුදල් කළ බැඳුම්කරවල අනුක්‍රමික අංක සහ මුදල් කළ දිනය සඳහන් වාර්තාවක්.

වෙළෙඳ බැංකු වෙත නිකුත් කරන ලද බැඳුම්කර සහ ඊට යාකොට පොළී කූපන් පත් අලෙවි කරන මොහොත එළඹෙන තුරු මහ බැංකුවට අයත් සේ සැලකේ. වෙළෙඳ බැංකු භාරයේ ඇති මොනයම් හෝ බැඳුම්කරයක් නැතිවුවහොත් එය අලෙවි කරන ලද බැඳුම්කරයක් හැටියට සැලකේ.

එකී බැඳුම්කර මිළදී ගත් දිනය පිළිබඳ නොවිමසා බැඳුම්කරවලට සහ පොළී කූපන් පත්වලට මුදල් ගෙවීමට වෙළෙඳ බැංකුවලට සහ ඔවුන්ගේ ශාඛාවලට බලය පවරනු ලැබේ.

ඒ. ටී. ඩබ්ලිව්. ජෙහොරත්නම් | ඩබ්ලිව්. රාසපුත්‍රම්
වැ. බ. ප්‍රධාන ගණකාධිකාරී. | අධිපති.

ප්‍රධාන ගණකාධිකාරී,
ශ්‍රී ලංකා මහ බැංකුව,
ජනාධිපති මාවත,
කොළඹ 1.

ඇමුණුම

1980 මැයි..............

මහත්මයාණෙනි,

පහත නම සහ ආදර්ශ අත්සන සඳහන් මෙම ලිපිය රැගෙන එන්නාට භාරක බැඳුම්කර..........................................................................................බාර
(ගණන වචනින්)
දෙන මෙන්...................................................................................වන අපි ඉල්ලමු.
(වෙළෙඳ බැංකුවේ නම)

මෙකී බැඳුම්කර අලෙවි කරන අවස්ථාව දක්වා ආරක්ෂිතව තබා ගැනීමට අපි තරයේ වග බලා ගනිමු.

80.05.27 දින හා අංක 482 දරන චක්‍රලේඛය ප්‍රකාර සෑම මසකම 1 වැනි දිනත් සහ 16 වැනි දිනත් අප විසින් අලෙවි කරන ලද බැඳුම්කරවල අනුක්‍රමික අංක සඳහන් කොට ප්‍රකාශනයක් ද, සෑම මසකම එක් භාගයකදී අලෙවි කරන ලද බැඳුම්කර වල වටිනාකම වෙනුවෙන් "ශ්‍රී ලංකා මහ බැංකුව — බැඳුම්කර ගිණුම" ට හිමි වනසේ චෙක්පතක් ද එවීමට ක්‍රියා කරමු.

ලිපිය රැගෙන එන්නාගේ නම සහ ආදර්ශ අත්සන

.............................................................. ..............................................................

මේ වගට හිතවත්,

.............................................................. වෙනුවට
(වෙළෙඳ බැංකුවේ නම)

..............................................................
(බැංකුවේ අනුදත් අත්සන/අත්සන්)

---

චක්‍රලේඛ අංක: 536

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ.පෙ. 590,
කොළඹ.
1980 දෙසැම්බර් 19 වැනි දින.

## ශ්‍රී ලංකා මහ බැංකුව

## 1985 6% භාරක බැඳුම්කර

1 1980 මැයි 27 වැනි දින අංක 482 දරන චක්‍රලේඛය යටතේ නිකුත් කරන ලද භාරක බැඳුම්කරයන්ගේ කල් පිරීමේ සීමාව අඩු කිරීමට මහ බැංකුව තීරණය කළ බව මෙමගින් සියළුම වෙළෙඳ බැංකුවලට දන්වනු ලැබේ. එබැවින් මෙකී භාරක බැඳුම්කරවල කල් පිරීමේ සීමාව 1983 මාර්තු 01 වැනි දිනය වනු ඇත.

2. ඒ අනුව, දරන්නාගේ මනාපය පරිදි, මෙකී බැඳුම්කර 1983 මාර්තු 01 වැනි දිනදී මතුපිට වටිනාකමට මුදල් කරවා ගත හැක. 1983 මාර්තු 01 වැනි දින බැඳුම්කර මුදලට මාරු කළහොත් පොළී කූපන් අංක 7–10 (අංක දෙකම ඇතුළත්ව) අවලංගු හැටියට සැළකේ.

3. මුදලට මාරු කරනු ලබන බැඳුම්කර වටිනාකම් ප්‍රමාණය අනුව සියයට $\frac{1}{4}$ ක කොමිස් මුදලක් මහ බැංකුව විසින් වෙළෙඳ බැංකුවලට ගෙවන බැව් වැඩි දුරටත් සියළුම වෙළෙඳ බැංකුවලට නිවේදනය කෙරේ.

ඩබ්ලිව්. රාසපුත්‍රම්
අධිපති.

යූ. ඒ. ද සිල්වා
ප්‍රධාන ගණකාධිකාරී.

චක්‍රලේඛ අංක: 537

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1980 දෙසැම්බර් 29 වැනි දින

## වෙළෙඳ බැංකු ණය

1981 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, වෙළෙඳ බැංකුවක් මහ බැංකු පොළී අනුපාතිකය යටතේ මහ බැංකුව වෙතින් ලබා ගත් ණය මුදල් ප්‍රමාණය 1980 අගෝස්තු අවසානයේදී එකී බැංකුව සතුව පවත්නා පහත සඳහන් වත්කම් ශීර්ෂ යන්ගේ මුළු එකතුවෙන් සියයට 3 ප්‍රමාණය නොඉක්මවිය යුතු අතර, එය සෑම බැංකුවකටම අදාලව රුපියල් දශ ලක්ෂ 2 ක අවමයකට යටත් වේ;

(1) වට්ටම් කරන ලද සහ මූල්‍ය පහසුකම් සැලසූ බිල්පත්;

(2) ණය (රජයේ කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රම යටතේ අනුමත කරන ලද ණය හැර) සහ

(3) අයිරාවන්.

කෙසේ වුවද, යම් බැංකුවක් විසින් මහ බැංකුව වෙතින් ලබා ගත්, 1981 ජනවාරි 1 වැනි දින වනවිට ආපසු ගෙවා නිම කිරීමට ඇති ණය මුදල, නියමිත සීමාව (අදළ බැංකුව වෙත පසුව දනුම් දෙන) ඉක්මවයි නම් අතිරික්ත මුදල් එකී බැංකුව විසින් 1981 ජනවාරි 15 වැනි දිනට පෙර මහ බැංකුව වෙත ආපසු ගෙවිය යුතුය. රජයේ කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය යටතේ, සහතික මිල යෝජනා ක්‍රමය සහ මැදි හා දීර්ඝ කාලීන ණය අරමුදල යටතේ අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් 'මහ බැංකුව වෙතින් ණයට ගන්නා ලද මුදල්' යන්නට නොගැනේ.

කෙසේ වුවද, තාවකාලික මුදල් හිඟයන් පියවා ගැනීම සඳහා වෙළෙඳ බැංකු විසින් මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ඉල්ලුම් පත්, 1980 අප්‍රේල් 21 වැනි දින හා අංක 476 දරන චක්‍රලේඛයේ 2 වැනි ඡේදයේ විධිවිධාන අනුව නියමිත සීමාව ඉක්මවා මහ බැංකුව විසින් සළකා බලනු ලැබේ.

1976 ඔක්තෝබර් 4 වැනි දින හා අංක 169 දරන චක්‍රලේඛයේ 2 ඡේදයේ විධිවිධාන දිගටම ක්‍රියාත්මකව පවතී. එනම්, සෑම වෙළෙඳ බැංකුවක් විසින්ම—

(අ) අත්‍යවශ්‍ය නොවන කටයුතු සඳහා අනුමත කරන ලද ණය සහ අත්තිකාරම්වල මුළු එකතුව 1976 ජූනි 30 වැනි දිනට එවැනි අත්‍යවශ්‍ය නොවන කටයුතු සඳහා දෙන ලද ණය සහ අත්තිකාරම්වල මුළු එකතුව සහ පියවීමට ඇති ප්‍රමාණය නොඉක්මවිය යුතුය; සහ

(ආ) කුලී පිට ගැනුම් කාර්යයන්හි නියැලී සිටින සහ/හෝ මහජනයා වෙත මුදල් ණයට දෙන ව්‍යාපාරික කටයුතුවල නියැලී සිටින බැංකු නොවන සමාගම් සහ ආයතන අනුමත කරන ලද ණය සහ අත්තිකාරම්වල මුළු එකතුව 1976 ජූනි 30 වැනි දිනට එවැනි සමාගම් සහ ආයතන විසින් දෙන ලද මුළු ණය සහ අත්තිකාරම්හි එකතුව සහ ගෙවා නොනිමි ප්‍රමාණය, 1978 මාර්තු 27 වැනි දින හා අංක 289 දරන චක්‍රලේඛ ලිපියේ විධිවිධානයන්ට අනුව නොඉක්මවිය යුතුය.

යූ. ඒ. ද සිල්වා
ප්‍රධාන ගණකාධිකාරී.

වර්ණසේන රාසපුත්‍රම්
අධිපති.

## ආසියානු මූල්‍ය ඒකක, බංගලිදේශ ටාකා, බුරුම ක්‍යාට්, ඉන්දියානු රුපියල, අයිරාන රියාල්, නේපාල රුපියල හා පකිස්ථානු රුපියල සඳහා මහ බැංකු විනිමය අනුපාතිකයන්.

මෙම අනුපාතිකයන් ආසියානු නිෂ්කාශන සංගමය මගින් කෙරෙන එතැන් සහ ඉදිරි මෙහෙයවුම් කටයුතු සඳහා අදළ වේ.

(එක් එක් ව්‍යවහාර මුදල් වර්ගයේ ඒකක සියයක් සඳහා රුපියල්)

| දිනය | චක්‍රලේඛ අංක | ආසියානු මූල්‍ය ඒකකය | | බංගලිදේශ ටාකා | | බුරුම ක්‍යාට් | | ඉන්දියානු රුපියල් | | අයිරාන රියාල් | | නේපාල රුපියල් | | පකිස්ථානු රුපියල් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මිළදී ගැණුම් එතැන්* | විකුණුම් එතැන්** | මිළදී ගැණුම් එතැන්† | විකුණුම් එතැන්‡ | මිළදී ගැණුම් එතැන්† | විකුණුම් එතැන්‡ | මිළදී ගැණුම් එතැන්† | විකුණුම් එතැන්‡ | මිළදී ගැණුම් එතැන්† | විකුණුම් එතැන්‡ | මිළදී ගැණුම් එතැන්† | විකුණුම් එතැන්‡ | මිළදී ගැණුම් එතැන්† | විකුණුම් එතැන්‡ |
| 80·01·14 | 451 | 2,053·20 | 2,053·70 | 100·33 | 100·45 | 241·29 | 241·41 | 195·71 | 195·83 | 22·18 | 22·22 | 130·31 | 130·43 | 157·85 | 157·97 |
| 80·01·25 | 454 | 2,040·75 | 2,041·25 | 101·66 | 101·78 | 239·82 | 239·94 | 194·04 | 194·16 | 21·89 | 21·93 | 128·64 | 128·76 | 155·82 | 155·94 |
| 80·02·18 | 457 | 2,030·20 | 2,030·70 | 102·34 | 102·46 | 238·58 | 238·70 | 195·50 | 195·62 | 21·87 | 21·91 | 128·52 | 128·64 | 155·68 | 155·80 |
| 80·02·27 | 459 | 2,030·20 | 2,030·70 | 102·34 | 102·46 | 238·58 | 238·70 | 193·04 | 193·16 | 21·87 | 21·91 | 128·52 | 128·64 | 155·68 | 155·80 |
| 80·03·10 | 462 | 1,999·85 | 2,000·35 | 100·45 | 100·57 | 235·02 | 235·14 | 190·67 | 190·79 | 21·87 | 21·91 | 128·52 | 128·64 | 155·68 | 155·80 |
| 80·03·19 | 465 | 2,061·50 | 2,062·00 | 102·17 | 102·29 | 242·26 | 242·38 | 196·31 | 196·43 | 22·61 | 22·65 | 132·85 | 132·97 | 160·91 | 161·03 |
| 80·04·15 | 469 | 2,032·30 | 2,032·80 | 101·08 | 101·20 | 238·83 | 238·95 | 199·72 | 199·84 | 23·03 | 23·07 | 135·32 | 135·44 | 163·91 | 164·03 |
| 80·04·21 | 473 | 2,078·40 | 2,078·90 | 103·44 | 103·56 | 244·25 | 244·37 | 203·69 | 203·81 | 23·24 | 23·28 | 136·55 | 136·67 | 165·39 | 165·51 |
| 80·05·09 | 477 | 2,116·50 | 2,117·00 | 106·44 | 106·56 | 248·73 | 248·85 | 204·75 | 204·87 | 23·23 | 23·27 | 136·50 | 136·62 | 165·33 | 165 45 |
| 80·05·16 | 479 | 2,075·25 | 2,075·75 | 104·85 | 104·97 | 243·88 | 244·00 | 201·69 | 201·81 | 22·68 | 22·72 | 133·27 | 133·39 | 161·43 | 161·55 |
| 80·06·06 | 483 | 2,101·35 | 2,101·85 | 107·64 | 107·76 | 246·95 | 247·07 | 203·91 | 204·03 | 22·67 | 22·71 | 133·36 | 133·48 | 161·53 | 161·65 |
| 80·07·16 | 488 | 2,124·05 | 2,124·55 | 108·96 | 109·08 | 249·61 | 249·73 | 205·76 | 205·88 | 22·98 | 23·02 | 133·36 | 133·48 | 161·53 | 161·65 |
| 80·08·01 | 491 | 2,128·85 | 2,129·35 | 105·34 | 105·46 | 250·18 | 250·30 | 206·35 | 206·47 | 23·04 | 23·08 | 133·36 | 133·48 | 161·53 | 161 65 |
| 80·08·08 | 494 | 2,100·20 | 2,100·70 | 103·92 | 104·04 | 246·81 | 246·93 | 203·57 | 203·69 | 22·73 | 22·77 | 133·36 | 133·48 | 161·53 | 161·65 |
| 80·08·12 | 496 | 2,149·70 | 2,150·20 | 106·37 | 106·49 | 252·63 | 252·75 | 208·37 | 208·49 | 23·27 | 23·31 | 136·50 | 136·62 | 165·34 | 165·46 |
| 80·08·18 | 498 | 2,149·05 | 2,149·55 | 106·18 | 106·30 | 252·55 | 252·67 | 209·17 | 209·29 | 23·31 | 23·35 | 136·19 | 136·31 | 164·97 | 165·09 |
| 80·09·02 | 502 | 2,210·20 | 2.210.70 | 110·02 | 110·14 | 259·74 | 259·86 | 216·38 | 216·50 | 23·95 | 23·99 | 140·38 | 140·50 | 170·04 | 170·16 |
| 80·09·25 | 507 | 2,251·70 | 2,252·20 | 112·07 | 112·19 | 264·62 | 264·74 | 220·88 | 221·00 | 24·35 | 24·39 | 142·18 | 142·30 | 172·22 | 172·34 |
| 80·10·01 | 509 | 1981 ඔක්තෝබර් 1 දින සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ආසියානු මූල්‍ය ඒකකය සඳහා විනිමය අනුපාතික ප්‍රකාශ කිරීම අත්හිටුවන ලදී. | | 112·87 | 113·09 | 263·32 | 263·84 | 218·97 | 219·41 | 24·29 | 24·33 | 141·72 | 142·00 | 171·65 | 171·99 |
| 80·10·16 | 513 | | | 112·18 | 112·40 | 263·20 | 263·72 | 219·36 | 219·80 | 24·26 | 24·30 | 141·86 | 142·14 | 171·82 | 172·16 |
| 80·10·21 | 515 | | | 108·17 | 108·39 | 267·21 | 267·75 | 222·71 | 223·15 | 24·63 | 24·67 | 144·02 | 144·30 | 174·44 | 174·78 |
| 80·11·03 | 517 | | | 111·93 | 112·15 | 269·75 | 270·29 | 228·91 | 229·37 | 24·87 | 24·91 | 147·93 | 148·23 | 179·17 | 179·53 |
| 80·11·10 | 519 | | | 111·93 | 112·15 | 269·75 | 270·29 | 231·64 | 232·10 | 24·87 | 24·91 | 147·93 | 148·23 | 179·17 | 179·53 |
| 80·11·13 | 521 | | | 110·45 | 110·67 | 266·16 | 266·70 | 228·56 | 229·02 | 24·54 | 24·58 | 147·93 | 148·23 | 179·17 | 179·53 |
| 80·11·19 | 524 | | | 110·69 | 110·91 | 270·24 | 270·78 | 231·00 | 231·46 | 24·92 | 24·96 | 147·93 | 148·23 | 179·17 | 179·53 |
| 80·11·25 | 527 | | | 109·34 | 109·56 | 266·94 | 267·48 | 228·18 | 228·64 | 24·61 | 24·65 | 147·93 | 148·23 | 179·17 | 179·53 |
| 80·11·27 | 529 | | | 107·19 | 107·41 | 266·94 | 267·48 | 225·51 | 225·97 | 24·61 | 24·65 | 147·93 | 148·23 | 179·17 | 179·53 |
| 80·12·05 | 531 | | | 109·11 | 109·33 | 270·72 | 271·26 | 229·55 | 230·01 | 24·96 | 25·00 | 149·80 | 150·10 | 181·43 | 181·79 |
| 80·12·16 | 534 | | | 107·55 | 107·77 | 266·45 | 266·99 | 226·25 | 226·71 | 24·57 | 24·61 | 149·99 | 150·29 | 181·67 | 182·03 |
| 80·12·29 | 538 | | | 109·23 | 109·45 | 270·62 | 271·16 | 229·79 | 230·25 | 24·95 | 24·99 | 150·35 | 150·65 | 182·10 | 182·46 |

ආ. මු. ඒ.   * එතැන් ගැණුම් සඳහා මසකට වට්ටම ශත 50 බැගින්
** එතැන් විකුණුම් සඳහා මසකට අධි මිළ ශත 50 බැගින්

අනෙකුත් ව්‍යවහාර මුදල් – † එතැන් ගැණුම් සඳහා මසකට වට්ටම ශත 06 බැගින්
– ‡ එතැන් විකුණුම් සඳහා මසකට අධිමිළ ශත 04 බැගින්

80–10–1 සිට

| | ගැණුම් | | | | | විකුණුම් | | විකුණුම් කරුවන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බංගලිදේශ ටාකා – එතැන් ගැණුම් සඳහා මසකට වට්ටම | | | | | | ශත 10 | බැගින් | එතැන් විකුණුම් කරුවන් සඳහා මසකට අධි මිළ | | | | | | ශත 10 | බැගින් |
| බුරුම ක්‍යාට් | ,, | ,, | ,, | ,, | ,, | ,, 25 | ,, | ,, | ,, | ,, | ,, | ,, | ,, | ,, 25 | ,, |
| ඉන්දියානු රුපියල් | ,, | ,, | ,, | ,, | ,, | ,, 20 | ,, | ,, | ,, | ,, | ,, | ,, | ,, | ,, 20 | ,, |
| අයිරාන රියාල් | ,, | ,, | ,, | ,, | ,, | ,, 02 | ,, | ,, | ,, | ,, | ,, | ,, | ,, | ,, 02 | ,, |
| නේපාල සහ පකිස්ථානු රුපියල් | | ,, | ,, | ,, | | ,, 15 | ,, | ,, | ,, | ,, | ,, | ,, | ,, | ,, 15 | ,, |

කොන්ත්‍රාත්තු වෙළෙඳ බැංකුවේ මනාපය පරිදි ගතයුතු වන නමුදු කොන්ත්‍රාත්තු කාලසීමාව ඉකුත්වීමට පෙර ගනු ලැබුවේ නම් කොන්ත්‍රාත්තුවේ සඳහන් විනිමය අනුපාතිකය අනුව ගතයුතු වෙයි.

# ආසියානු නිෂ්කාශණ සංගමය මගින් කෙරෙන මෙහෙයවුම් කටයුතු සඳහා වෙළෙඳ බැංකු විනිමය අනුපාතිකයන්

(එක් එක් ව්‍යාවහාර මුදල් වර්ගයේ ඒකක සියයක් සඳහා රුපියල්)

| දිනය | චක්‍රලේඛ අංක | ආසියානු මූල්‍ය ඒකකය | | බංගලිදේශ ටාකා | | බුරුම ක්යාට් | | ඉන්දියානු රුපියල් | | අයිරාන රියාල් | | නේපාල රුපියල් | | පකිස්ථානු රුපියල් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් |
| 80·01·14 | 452 | මහ බැංකුවේ ගැනුම් අනුපාතිකයට පහළින් රු.ශ. 1.50 බ කොටදී | මහ බැංකුවේ විකුණුම් අනුපාතිකයට ඉහළින් රු.ශ. 3·00 බ කොටදී | 100·27 | 100·49 | 241·23 | 241·45 | 195·65 | 195·87 | 22·12 | 22·26 | 130·25 | 130·47 | 157·79 | 158·01 |
| 80·01·25 | 455 | | | 101·60 | 101·82 | 239·76 | 239·98 | 193·98 | 194·20 | 21·83 | 21·97 | 128·58 | 128·80 | 155·76 | 155·98 |
| 80·02·18 | 458 | | | 102·28 | 102·50 | 238·52 | 238·74 | 195·44 | 195·66 | 21·81 | 21·95 | 128·46 | 128·68 | 155·62 | 155·84 |
| 80·02·27 | 460 | | | 102·28 | 102·50 | 238·52 | 238·74 | 192·98 | 193·20 | 21·81 | 21·95 | 128·46 | 128·68 | 155·62 | 155·84 |
| 80·03·10 | 463 | | | 100·39 | 100·61 | 234·9( | 235·18 | 190·61 | 190·83 | 21·81 | 21·95 | 128·46 | 128·68 | 155·62 | 155·84 |
| 80·03·19 | 466 | | | 102·11 | 102·33 | 242·2( | 242·42 | 196·25 | 196·47 | 22·55 | 22·69 | 132·79 | 133·01 | 160·85 | 161·07 |
| 80·04·15 | 470 | | | 101·02 | 101·24 | 238·77 | 238·99 | 199·66 | 199·88 | 22·97 | 23·11 | 135·26 | 135·48 | 163·85 | 164·07 |
| 80·04·21 | 474 | | | 103·38 | 103·60 | 244·19 | 244·41 | 203·63 | 203·85 | 23·18 | 23·32 | 136·49 | 136·71 | 165·33 | 165·55 |
| 80·05·09 | 478 | | | 106·38 | 106·60 | 248·67 | 248·89 | 204·69 | 204·91 | 23·17 | 23·31 | 136·44 | 136·66 | 165·27 | 165·49 |
| 80·05·16 | 480 | | | 104·79 | 105·01 | 243·82 | 244·04 | 201·63 | 201·85 | 22·62 | 22·76 | 133·21 | 133·43 | 161·37 | 161·59 |
| 80·06·06 | 484 | | | 107·58 | 107·80 | 246·89 | 247·11 | 203·85 | 204·07 | 22·61 | 22·75 | 133·30 | 135·52 | 161·47 | 161·69 |
| 80·07·16 | 489 | | | 108·90 | 109·12 | 249·55 | 249 77 | 205·7( | 205·92 | 22·92 | 23·06 | 133·3( | 133·52 | 161·47 | 161·69 |
| 80·08·01 | 492 | | | 105·28 | 105·50 | 250·12 | 250·34 | 206·29 | 206·51 | 22·98 | 23·12 | 133·30 | 133·52 | 161·47 | 161·69 |
| 80·08·08 | 495 | | | 103·86 | 104·08 | 246·75 | 246·97 | 203·51 | 203·73 | 22·67 | 22·81 | 133·30 | 133·52 | 161·47 | 161·69 |
| 80·08·12 | 497 | | | 106·31 | 106·53 | 252·57 | 252 79 | 208·31 | 208·53 | 23·21 | 23·35 | 136·44 | 136·66 | 165·28 | 165·50 |
| 80·08·18 | 499 | | | 106·12 | 106·34 | 252·49 | 252·71 | 209·11 | 209·33 | 23·25 | 23·39 | 136·13 | 136·35 | 164·91 | 165·13 |
| 80·09·02 | 503 | | | 109·96 | 110·18 | 259·68 | 259·90 | 216·32 | 216·54 | 23·89 | 24·03 | 140·32 | 140·54 | 169·98 | 170·20 |
| 80·09·25 | 508 | | | 112·01 | 112·23 | 264·56 | 264·78 | 220·82 | 221·04 | 24·29 | 24·43 | 142·12 | 142·34 | 172·16 | 172·38 |
| 80·10·01 | 510 | | | 112·77 | 113·19 | 263·07 | 264·09 | 218·77 | 219·61 | 24·27 | 24·35 | 141·57 | 142·15 | 171·5( | 172·14 |
| 80·10·16 | 514 | | | 112·08 | 112·50 | 262·95 | 263·97 | 219·16 | 220·00 | 24·24 | 24·32 | 141·71 | 142·29 | 171·67 | 172·31 |
| 80·10·21 | 516 | | | 108·07 | 108·49 | 266·96 | 268·00 | 222·51 | 223·35 | 24·61 | 24·69 | 143·87 | 144·45 | 174·29 | 174·93 |
| 80·11·03 | 518 | | | 111·83 | 112·25 | 269·50 | 270·54 | 228·71 | 229·57 | 24·85 | 24·93 | 147·78 | 148·38 | 179·02 | 179·68 |
| 80·11·10 | 520 | | | 111·83 | 112·25 | 269·50 | 270·54 | 231·44 | 232·30 | 24·85 | 24·93 | 147·78 | 148·38 | 179·02 | 179·68 |
| 80 11·13 | 522 | | | 110 35 | 110·77 | 265·91 | 266·95 | 228·36 | 229·22 | 24·52 | 24·60 | 147·78 | 148·38 | 179·02 | 179·68 |
| 80·11·19 | 525 | | | 110·59 | 111·01 | 269·99 | 271·03 | 230·80 | 231·66 | 24·90 | 24·98 | 147·78 | 148·38 | 179·02 | 179·68 |
| 80·11 25 | 528 | | | 109·24 | 109·66 | 266·69 | 267·73 | 227·98 | 228·84 | 24·59 | 24·67 | 147·78 | 148·38 | 179·02 | 179·68 |
| 80·11·27 | 530 | | | 109·24 | 107·09 | 107·51 | 225·31 | 226·17 | 228·84 | 24·59 | 24·67 | 147·78 | 148·38 | 179·02 | 179·68 |
| 80·12·05 | 532 | | | 109·01 | 109·43 | 270·47 | 271·51 | 229·35 | 230·21 | 24·94 | 25·02 | 149·65 | 150·25 | 181·28 | 181·94 |
| 80·12·16 | 535 | | | 107·45 | 107·87 | 266·20 | 267·24 | 226·05 | 226·91 | 24·55 | 24·63 | 149·84 | 150·44 | 181·57 | 182·18 |
| 80·12·29 | 539 | | | 109·13 | 109·55 | 270·37 | 271·41 | 229·59 | 230·45 | 24·93 | 25·01 | 150·2( | 150·80 | 181·95 | 182·61 |

## වෙළෙඳ බැංකු වලින් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිළ දී ගැනීම සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතිකයන්

| දිනය | ධනලේඛ අංකය | ඔස්ට්‍රේලියානු ඩොලර් (ඩොලර් 1 කට) | ඔස්ට්‍රියානු ෂිලිං (ෂිලිං 100 කට) | බහරේන් ඩිනාර් (ඩිනාර් 1-) | බෙල්ජියානු ෆ්‍රෑන්ක් (බෙ. ෆ්‍රෑ. 100/-) | කැනේඩියානු ඩොලර් (ඩොලර් 1/-) | ඩෙනිෂ් ක්‍රෝනර් (ක්‍රෝ. 10/-) | ඩොයිෂ් මාර්ක්ස් (ඩො. මා. 10/-) | ෆ්‍රංශ ෆ්‍රෑන්ක් (ෆ්‍ර. ෆ්‍රෑ. 10/-) | හොංකොං ඩොලර් (ඩොලර් 10/-) | ඉතාලියානු ලීරා (ලීරා 1000/-) | ජපන් යෙන් (යෙන් 1000/-) | කුවේට් ඩිනාර් (ඩිනාර් 1/-) | මැලේසියානු රින්ගිට් (රින්ගිට් 10/-) | නෙදර්ලන්ත ගිල්ඩර් (ගිල්. 10/-) | නෝර්වීජියානු ක්‍රෝනර් (ක්‍රෝ. 10/-) | ඕමාන් රියාල් (රි. 1/-) | කටාර් රියාල් (රි. 10/-) | සවුදි අරාබි රියාල් (රි. 10/-) | සිංගප්පූරු ඩොලර් (ඩො. 10/-) | ස්වීඩන් ක්‍රෝනර් (ක්‍රෝ. 10 -) | ස්විස් ෆ්‍රෑන්ක් (ෆ්‍රෑ. 10/-) | එක්සත් අරාබි ඩර්හෑම (ඩර්හෑම 10/-) | එ. රා. පවුම (පවුම 1/-) | එ. ජ. ඩොලර් (ඩොලර් 1/-) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 80·01·12 .. | 453 | 16·40 | 119·55 | 39·30 | 52·90 | 12·70 | 27·50 | 85·90 | 36·65 | 30·30 | 18·40 | 61·95 | 54·65 | 67·90 | 77·85 | 30·20 | 42·90 | 40·15 | 44·15 | 68·75 | 35·80 | 93·65 | 39·65 | 33·85 | 14·85 |
| 80·02·11 .. | 456 | 16·50 | 119·70 | 39·45 | 52·80 | 12·85 | 27·35 | 85·70 | 36·55 | 30·75 | 18·45 | 61·75 | 54·75 | 68·50 | 77·65 | 30·60 | 43·15 | 40·55 | 44·35 | 69·20 | 35·95 | 92·05 | 39·85 | 34·30 | 14·90 |
| 80·03·03 .. | 461 | 16·60 | 119·55 | 40·05 | 52·60 | 13·25 | 27·45 | 85·40 | 36·50 | 30·55 | 18·45 | 61·20 | 55·20 | 69·40 | 77·65 | 30·85 | 43·80 | 41·15 | 45·05 | 69·85 | 36·00 | 88·85 | 40·55 | 34·35 | 15·15 |
| 80·03·14 . | 464 | 16·85 | 118·25 | 40·65 | 51·85 | 13·10 | 26·95 | 84·25 | 36·10 | 30·80 | 18·15 | 62·10 | 55·80 | 69·60 | 76·65 | 30·55 | 44·55 | 41·85 | 45·95 | 69·90 | 35·70 | 88·10 | 41·15 | 34·10 | 15·40 |
| 80·03·23 .. | 467 | 16·80 | 114·95 | 41·20 | 50·90 | 13·00 | 26·20 | 81·85 | 35·20 | 30·55 | 17·60 | 62·25 | 56·40 | 68·95 | 74·70 | 30·30 | 44·75 | 42·10 | 46·75 | 69·25 | 35·10 | 86·70 | 41·40 | 33·95 | 15·50 |
| 80·04·07 .. | 468 | 16·85 | 112·30 | 41·75 | 49·90 | 13·20 | 25·95 | 80·00 | 34·75 | 31·00 | 17·35 | 60·40 | 56·95 | 67·85 | 73·20 | 30·40 | 44·90 | 42·90 | 47·40 | 68·20 | 34·95 | 84·50 | 42·25 | 33·70 | 15·75 |
| 80·04·15 .. | 471 | 17·00 | 116·65 | 41·25 | 51·55 | 13·15 | 26·80 | 83·10 | 35·95 | 31·20 | 17·90 | 62·00 | 56·65 | 68·45 | 75·80 | 30·75 | 45·70 | 42·95 | 46·75 | 69·60 | 35·65 | 89·25 | 42·25 | 34·35 | 15·60 |
| 80·04·17 .. | 472 | 16·90 | 115·85 | 41·25 | 51·95 | 13·00 | 26·60 | 83·50 | 35·95 | 30·85 | 17·85 | 62·15 | 56·60 | 67·80 | 76·25 | 30·55 | 45·65 | 42·90 | 46·90 | 69·55 | 35·55 | 90·00 | 42·20 | 34·30 | 15·40 |
| 80·05·15 .. | 481 | 17·35 | 120·25 | 40·80 | 53·20 | 13·05 | 27·35 | 85·65 | 36·60 | 31·30 | 18·20 | 67·40 | 57·15 | 70·80 | 77·80 | 31·25 | 45·05 | 42·35 | 45·00 | 71·30 | 36·35 | 92·35 | 41·85 | 35·20 | 15·35 |
| 80·06·06 .. | 485 | 17·65 | 121·65 | 40·90 | 54·30 | 13·30 | 27·85 | 86·80 | 37·25 | 31·25 | 18·45 | 70·00 | 57·40 | 71·55 | 79·00 | 31·55 | 44·50 | 42·05 | 46·20 | 72·20 | 36·85 | 93·55 | 41·55 | 35·90 | 15·35 |
| 80·06·18 .. | 486 | 17·80 | 122·75 | 40·90 | 54·55 | 13·35 | 28·15 | 87·35 | 37·50 | 31·30 | 18·50 | 71·40 | 57·70 | 72·15 | 79·75 | 31·55 | 44·55 | 42·35 | 46·25 | 72·75 | 37·00 | 94·85 | 41·60 | 35·90 | 15·40 |
| 80·06·25 .. | 487 | 17·80 | 122·85 | 41·00 | 54·45 | 13·40 | 28·10 | 87·10 | 37·50 | 31·30 | 18·40 | 71·20 | 57·65 | 71·90 | 79·50 | 31·75 | 44·65 | 42·40 | 46·35 | 72·75 | 36·95 | 94·00 | 41·70 | 36·00 | 15·40 |
| 80·07·16 .. | 490 | 17·90 | 124·45 | 41·00 | 55·25 | 13·35 | 28·50 | 88·25 | 38·00 | 31·45 | 18·55 | 70·45 | 58·05 | 72·00 | 80·70 | 32·05 | 44·70 | 42·45 | 46·55 | 73·05 | 37·40 | 95·75 | 41·70 | 36·60 | 15·45 |
| 80 07 31 .. | 493 | 18·00 | 123·95 | 41·35 | 55·00 | 13·40 | 28·45 | 87·90 | 37·95 | 31·60 | 18·40 | 69·10 | 57·90 | 72·30 | 80·60 | 32·05 | 45·20 | 42·95 | 47·05 | 73·25 | 37·60 | 94·85 | 42·35 | 36·65 | 15·60 |
| 80·08·15 .. | 500 | 18·35 | 125·30 | 41·95 | 55·55 | 13·65 | 28·70 | 88·65 | 38·30 | 32·05 | 18·70 | 70·50 | 59·20 | 73·80 | 81·60 | 32·60 | 45·85 | 43·05 | 47·80 | 74·35 | 38·00 | 96·25 | 42·95 | 37·65 | 15·80 |
| 80·08·28 .. | 501 | 18·75 | 126·40 | 42·65 | 55·95 | 13·90 | 28·95 | 89·60 | 38·55 | 32·55 | 18·85 | 73·65 | 60·30 | 75·15 | 82·20 | 33·15 | 46·60 | 44·25 | 48·55 | 75·75 | 38·55 | 97·15 | 43·68 | 38·55 | 16·10 |
| 80·09·01 .. | 504 | 18·75 | 126·70 | 42·90 | 56·05 | 13·90 | 29·05 | 90·00 | 38·75 | 32·55 | 18·85 | 73·70 | 60·65 | 75·60 | 82·60 | 33·30 | 47·35 | 44·95 | 48·75 | 75·95 | 38·65 | 97·90 | 44·35 | 38·70 | 16·10 |
| 80·09·11 .. | 505 | 19·00 | 128·95 | 42·95 | 56·95 | 13·95 | 29·55 | 91·40 | 39·30 | 32·75 | 19·20 | 75·30 | 58·80 | 76·80 | 84·00 | 33·75 | 46·95 | 44·15 | 49·10 | 76·70 | 39·15 | 99·80 | 43·45 | 39·10 | 16·20 |
| 80·09·19 .. | 506 | 19·20 | 129·30 | 43·35 | 57·05 | 13·05 | 29·50 | 91·45 | 39·40 | 33·15 | 19·25 | 77·00 | 61·30 | 77·45 | 84·15 | 33·75 | 47·45 | 44·65 | 49·30 | 77·80 | 39·40 | 99·80 | 43·90 | 39·10 | 16·40 |
| 80·10·11 .. | 511 | 19·35 | 128·90 | 43·70 | 56·90 | 14·10 | 29·55 | 91·20 | 39·30 | 33·00 | 19·15 | 78·75 | 61·65 | 77·65 | 84·00 | 33·95 | 47·75 | 45 35 | 49·75 | 78·60 | 39·70 | 99·95 | 44·75 | 39·35 | 16·50 |
| 80·10·13 .. | 512 | 19·45 | 129·90 | 43·80 | 57·15 | 14·20 | 29·80 | 91·80 | 39·60 | 33·05 | 19·30 | 79·30 | 61·95 | 78·35 | 84·45 | 34·10 | 47·95 | 45,50 | 49·80 | 79·15 | 39·80 | 101·40 | 44·90 | 39·85 | 16·55 |
| 80·10·22 .. | 513 | 19·90 | 128·85 | 44·90 | 56·80 | 14·50 | 29·55 | 90·75 | 39·35 | 33·60 | 19·20 | 81·30 | 63·50 | 79·55 | 83·80 | 34·35 | 49·05 | 46·55 | 51·80 | 81·25 | 40·25 | 102·25 | 45·90 | 41·40 | 16·95 |
| 80·11·18 .. | 523 | 20·15 | 126·45 | 45·85 | 55·85 | 14·55 | 29·20 | 89·70 | 38·70 | 33·70 | 18·95 | 81·10 | 64·05 | 79·75 | 82·80 | 34·45 | 50·05 | 47·00 | 52·25 | 82·50 | 40·10 | 99·85 | 46·85 | 41·45 | 17·30 |
| 80·11·24 .. | 526 | 20·20 | 126·95 | 45·70 | 56·10 | 14·60 | 29·35 | 90·10 | 38·80 | 34·10 | 19·00 | 81·10 | 63·65 | 79·60 | 83·15 | 34·40 | 50·10 | 47·10 | 52·05 | 82·70 | 39·55 | 100·00 | 46·95 | 40·75 | 17·30 |
| 80·12·12 .. | 533 | 20·20 | 121·65 | 46·05 | 53·40 | 14·45 | 28·05 | 86·00 | 37·15 | 33·35 | 18·15 | 82·95 | 63·85 | 78·35 | 79·25 | 33·05 | 50·35 | 47·80 | 52·45 | 81·80 | 38·80 | 94·90 | 47·40 | 40·30 | 17·40 |